

# කාසි හඳුනා ගැනීම හා ගනුදෙනු කිරීම





**ක්‍රියාකාරකම 01- කාසි සොයමු**

**සපයා ගත යුතු දේ-**

-  සබන් දියරෙන් හොඳින් සෝදා ගත් රුපියල , රුපියල් දෙක , රුපියල් පහ යන කාසි
-  හිස් භාණ්ඩ ඇසුරුම් 3 ක්
-  කාඩ්බෝඩ් කැබලිවල අලවන ලද රුපියල , රුපියල් දෙක , රුපියල් පහේ, කඩදාසි මත අච්චු ගසන ලද කාසි

දෙමාපියන්ට උපදෙස්

-  රුපියලේ කාසිය ගෙන මේසය මත තබන්න.
-  එය රුපියලේ කාසිය බව දරුවාට හඳුන්වා දෙන්න.
-  රුපියලේ කාසිය දරුවා අතට දෙමින් එම කාසියේ ප්‍රමාණය, පාට, දෙපැත්තේ ම සඳහන් වන දේවල් දෙස හොඳින් කිහිපවරක් බලමින් රුපියලේ කාසිය හඳුනා ගැනීමට අවස්ථාව ලබාදෙන්න .
-  රුපියල් දෙකේ කාසිය දරුවාට දෙන්න .කාසියේ ප්‍රමාණය, පාට, කාසියේ දෙපැත්තෙහි ම සඳහන් වන දේවල් හොඳින් බලමින් රුපියල් දෙකේ කාසිය හඳුනා ගැනීමට අවස්ථාව ලබාදෙන්න .
-  ඉන්පසු රුපියල් පහේ කාසිය ද ඉහත දැක් වූ පරිදි හඳුනා ගැනීමට අවස්ථාව ලබාදෙන්න.

**ක්‍රියාකාරකම 02 - කාසි සොයමු**

-  කාසි තුන ම මේසය මත තබන්න.
-  ඔබ එක කාසියක වටිනාකම පවසන්න.
-  එම කාසිය නිවැරදි ව හඳුනා ගෙන ඔබ “අතට දෙන්න” යි දරුවාට පවසන්න.
-  එක කාසියකින් තවත් කාසියක් වෙන් කර හඳුනා ගැනීමට හැකි වන ආකාරයට කාසි තුන ම වරින් වර මාරු කර තබමින් මෙම ක්‍රියාකාරකමෙහි කිහිපවරක් යෙදෙන්න.

**ක්‍රියාකාරකම 03 - කාසි අච්චු ගසමු**

-  රුපියල මත කඩදාසියක් තබා අච්චු ගැසීමට දරුවාට උදවු කරන්න.
-  කාසියේ අනිත් පැත්තද අච්චු ගසා ගන්න.
-  මෙසේ රුපියල් දෙක , රුපියල් පහ කාසිවල දෙපැත්තම අච්චු ගසා ගන්න.( හැකි නම් පාට පැන්සල් යොදා ගන්න.)

**ක්‍රියාකාරකම 04 - අපි කඩයක් දමමු**

-  “අපි කඩයක් දමමු ” යි දරුවාට පවසන්න.
-  භාණ්ඩ ඇසුරුම් තුන මේසය මත තබන්න.
-  ඒවා ඉදිරියෙන් රුපියල , රුපියල් දෙක හා රුපියල් පහ අච්චු ගසන ලද කාඩ්බෝඩ් තබන්න.
-  දරුවාගේ අතට රුපියල , රුපියල් දෙක , රුපියල් පහ යන කාසි දෙන්න.

- දරුවාට තමා කැමති භාණ්ඩයක් මිලදී ගැනීමට අවස්ථාව ලබා දෙන්න .
- මිලදී ගන්නා භාණ්ඩය පෙන්වා එහි ලකුණු කර ඇති මිල කියවීමට දරුවාට කියන්න
- භාණ්ඩයේ සඳහන් මිල ගෙවීමට , නිවැරදි කාසිය ලබා දෙනවා දැයි බලන්න.
- ඇසුරුම්වල තබා ඇති මිල ගණන් වෙනස් කරමින් රුපියල , රුපියල් 2 , රුපියල් 5 යන කාසි නිවැරදි ව හඳුනා ගනිමින් ගනුදෙනු කිරීමට දරුවාට අවස්ථාව ලබා දෙන්න.

---

*ගණිතය 1 ශ්‍රේණිය ගණිතය වැඩ පොතේ පිටු අංක 75, 76 ඇති අභ්‍යාස කිරීම සඳහා දරුවාට මඟ පෙන්වන්න.*

---